දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

| | | |
|---|---|---|
| අමාත්‍යතුමා<br>அமைச்சர்<br>Minister | } | 2784832<br>2784807<br>2785617 |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | } | 2784812 |
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | } | 2785141-50<br>Fax 2784846 |

ඊමේල්/ஈ - மெயில்/E-mail isurupaya@moe.gov.lk

ඔබේ අංකය
உமது இல.
Your No. }

**අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி அமைச்சு
**Ministry of Education**

'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாய' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla

මගේ අංකය
எமது இல.
My No. } ED/1/2/1/3/60

දිනය
திகதி
Date } 2013.01.15

**චක්‍රලේඛ අංකය : 6/2013**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලුම අධ්‍යක්ෂවරුන්
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලුම පාසල්වල විදුහල්පතිවරුන්

## <u>පාසල් උපදේශන හා මාර්ගෝපදේශ වැඩ සටහන</u>

ආත්ම අභිමානයෙන් යුතු ශ්‍රී ලාංකීය දරුවකු ලෝක ප්‍රජාව වෙත ඉදිරිපත් කිරීමේ භාරදූර කාර්යය වෙනුවෙන් රජය අධ්‍යාපනය සඳහා විශාල ආයෝජනයක් සිදු කරනු ලබයි. එම අපේක්ෂිත ඵලය සපල කර ගැනීමට පාසල තුළදී විවිධ දැනුම් ඇතුළත් විධිමත් විෂය මාලාවන් සමඟ එයට උපකාරී වන ප්‍රායෝගික ජීවන කුසලතා ඇතුළත් වෙනත් වැඩ සටහන්ද ඒකාබද්ධව පාසල තුළ ක්‍රියාත්මක කෙරේ.

සංවර්ධන ක්‍රියාවලියේදී මානව සම්පත් සංවර්ධනය වැදගත් වන අතර රටක සංවර්ධනයේ ස්ථාපිත සාධකය වන්නේ අනාගත මිනිස් බල සැලසුම්කරණයයි. එහිදී පාසල තුළ ජීවත්වන සිසුන්ගේ කායික, මානසික හා සමාජීය යහපැවැත්ම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

එම කාරණය වෙනුවෙන් පාසල් මට්ටමින් සෘජු සහායක සේවාවන් ලෙස මාර්ගෝපදේශන හා උපදේශන සේවාව ක්‍රියාත්මක කරනු ලබයි.

මේ සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති අංක 2001/16 චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

චක්‍රලේඛය තුළින් පහත කරුණු අනුගමනය කිරීමට උපදෙස් දෙනු ලැබේ.

1. වැඩ සටහන " **පාසල් උපදේශන හා මාර්ගෝපදේශ සේවා වැඩ සටහන** " නමින් ක්‍රියාත්මක කෙරේ.

2. සෑම පාසලකටම එම වැඩ සටහන සඳහා පහත සඳහන් කොන්දේසි යටතේ නිශ්චිතව නම් කළ ගුරුවරුන් සේවයේ යෙදිය යුතුයි.

(අ) සිසුන් 300 ට අඩු පාසල් සඳහා ගුරුවරයකු අර්ධ කාලීනව සේවාවේ යෙදවිය යුතුයි.

(ආ) සිසුන් 300 කට වැඩි සෑම පාසලක් සඳහාම පූර්ණ කාලීනව නිදහස් කළ ගුරුවරයකු සේවාවේ යෙදවිය යුතුයි.

(ඇ) ද්වි භාෂා හෝ ත්‍රිභාෂා වලින් ඉගැන්වීම් සිදුකරන්නේ නම් භාෂා මාධ්‍යය අනුව ඉහත ශිෂ්‍ය සංඛ්‍යාවන් සැලකිල්ලට ගනිමින් එක් එක් මාධ්‍ය සඳහා ගුරුවරයෙකු බැගින් සේවයේ යෙදවිය යුතුයි.

ඉහත (අ), (ආ) සහ (ඇ) කොටස් යටතේ ගුරුවරුන් යෙදවීම 2003/38 ගුරු සංඛ්‍යාව තීරණය කිරීමේ චක්‍රලේඛයට අනුකූලව යොදා ඇත.

(ඇ) එයට අමතරව පාසලේ ගුරු සංඛ්‍යාව ප්‍රමාණවත් වන්නේ නම් අංශ ගණනාවකින් යුත් පාසල් සඳහා ඒ ඒ පාසලේ අවශ්‍යතා පරිදි එම අංශ නියෝජනය වීම සඳහා උපදේශන ගුරුවරුන් පත්කර ගත හැකිය.

3 පාසල් උපදේශන හා මාර්ගෝපදේශ සේවාවට අයත් ගුරුවරයා අතිරික්ත ගුරුවරයෙක් නොවිය යුතු අතර කිසිවිටෙකත් අනුප්‍රාප්තිකයකු රහිතව මාරු නොකළ යුතුයි.

4 **ගුරුවරයෙක් තෝරා ගැනීම.**

(අ) ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 -II හෝ ඉන් ඉහළ ශ්‍රේණියක ස්ථිර ගුරුවරුයකු වීම.

(ආ) උසස් අන්තර් පුද්ගල සම්බන්ධතා පවත්වා ගැනීමේ හැකියාවෙන් යුක්ත අයකු වීම.

(ඇ) පාසල පිහිටි ප්‍රදේශය තුළ උපරිම කි.මී. 15 ක් ඇතුළත පදිංචි අයකු වීම වඩා සුදුසු වේ.

(ඈ) පෙර සේවා කාලය තුළ දඬුවම් හෝ විනයානුකූල හේතූන්ට ලක් නොවූ අයකු විය යුතුයි.

(ඉ) කායික හා මානසික නිරෝගීභාවය මනාව පිළිබිඹු වීම අත්‍යාවශ්‍ය සාධකයක් වේ.

(ඊ) මෙසේ තෝරාගනු ලබන සෑම ගුරුවරයකුහට මෙම සේවාව කරගෙන යාම සඳහා විධිමත් ලිපියක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කළ යුතුයි.

5. **උපදේශන කාර්යයේ යෙදෙන ගුරුවරුන් ශ්‍රේණිගත කිරීම.**

(අ) **උපදේශන සේවා සහකාර :**

පහත සඳහන් සුදුසුකම් සපුරාලන නොක් උපදේශන කාර්යයේ යෙදෙන ගුරුවරුන්

(ආ) **සහකාර ශිෂ්‍ය උපදේශක :**

උපදේශන සේවාව සඳහා පැය 60 කට වඩා වැඩි පහත ආයතනයන් තුළින් කෙටි කාලීන පුහුණුවක් ලබා ඇති ගුරුවරුන්

**පුහුණු ආයතන** - ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සහ කලාප අධ්‍යාපන කාර්යාල, විශ්ව විද්‍යාල හෝ ඒ හා සමාන පිළිගත් අධ්‍යාපන ආයතන, ශ්‍රී ලංකා පදනම් ආයතනය, ජාතික සමාජ සංවර්ධන ආයතනය හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි අධ්‍යාපන ආයතන

(ඇ) **ශිෂ්‍ය උපදේශක :**

ඉහත ආයතන වලින් පැය 200 කට වඩා පුහුණුවක් හෝ ඩිප්ලෝමාවක් ලැබුවන්.

(ඇ) **ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශක :**

උපදේශනය පිළිබඳ පැය 80 කට වඩා ප්‍රායෝගික පුහුණුව සහිත පශ්චාත් උපාධි මට්ටමේ සුදුසුකම් ලැබුවන් හෝ ඉහත (ආ) සුදුසුකම් සහිතව උපදේශනය හෝ මනෝ විද්‍යාව ඇතුළත් ශාස්ත්‍රපති උපාධිය හෝ ඉන් ඉහළ සුදුසුකම්.

6. **පාසල් උපදේශනය හා මාර්ගෝපදේශ වැඩ සටහන පාසල තුළ ක්‍රියාත්මක කිරීම.**

මේ සඳහා විශේෂ කමිටුවක් පාසල තුළ ක්‍රියාත්මක විය යුතුයි

" **පාසල් උපදේශනය හා මාර්ගෝපදේශ කමිටුව** " නමින් මෙම කමිටුව හැඳින්වේ.

(අ) **කමිටුවේ සංයුතිය. - මුළු සාමාජික සංඛ්‍යාව 10 යි**

විදුහල්පතිවරයා නිලබලයෙන් කමිටුවේ සභාපති වේ. පාසලේ සිටින පාසල් උපදේශනය හා මාර්ගෝපදේශ ගුරුවරයා කමිටුවේ ලේකම් හා කැඳවුම්කරු ලෙස කටයුතු කළ යුතුයි. නියෝජ්‍ය /සහකාර විදුහල්පතිවරුන්ගෙන් දෙදෙනෙක් හා එක් අංශ ප්‍රධාන ආචාර්යවරයෙක් කමිටු සාමාජිකයින් ලෙස පත් කළ යුතුයි

පාසල් ශිෂ්‍ය සුභසාධක කාර්යයන් කෙරෙ වැඩි නැඹුරුවක් ඇති ගුරුවරුන්ගෙන් දෙදෙනෙක් ගුරුමණ්ඩලයේ එකගත්වය මත අනෙක් සාමාජිකයන් දෙදෙනා ලෙස පත් කළ යුතුයි. පාසලේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය නායක නායිකාවන්ගෙන් දෙදෙනෙක් හා ක්‍රීඩා සහ විෂය සමගාමී අංශවල විශේෂ ක්‍රියාකාරීත්වයක් ඇති සිසුන් අතරින් වැඩි කුසලතාවයක් පෙන්නුම් කරන එක් සිසුවෙක් මේ සඳහා ඇතුළත් කල යුතුය.

මෙම කමිටුවේ සංයුතිය හා නාම ලේඛණය විදුහලේ කාර්යාලයේ ප්‍රදර්ශනය කළ යුතුයි.

(ආ) **කමිටුවේ කාර්ය භාරය :**

පහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කමිටුවේ විශේෂණයට ලක්විය යුතු අතර, කාලීන වශයෙන් පවතින ප්‍රවනතාවලදී ද එම සැලකිල්ල ගෙන විධිමත් විසඳුම් ලබාදෙන වැඩසටහන් පාසල තුළ ක්‍රියාත්මක කළ යුතුයි.

- පාසල් සිසුන්ගේ/ගුරුවරුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් මට්ටමක පවත්වා ගැනීම.
- පාසල් සිසුන්ගේ/ ගුරුවරුන්ගේ හඳුනාගත් සුවිශේෂ චර්යාවන් අනුව අවශ්‍ය කටයුතු කිරීම.
- සිසුන්ගේ සාධන මට්ටම් හා විභාග ප්‍රතිඵල උසස් මට්ටමක පවත්වාගෙන යාමට උදවු කිරීම.
- සිසුන්ගේ පාසල් පැමිණීම වර්ධනය කිරීමටත් ඇදහැලීම් අවම කිරීමටත් කටයුතු කිරීම.
- ගුරුවරුන්ගේ නිවාඩු ගැනීමට බලපාන විශේෂ තත්වයන් හඳුනා ගැනීම හා එය අවම කිරීමට සහාය වීම.
- පාසලේ අවදානම් කණ්ඩායම් ලෙස හඳුනාගත හැකි සිසුන් සඳහා කෙරෙන විශේෂ වැඩසටහන්.
- පාසල් පරිසරය හා එහි අවදානම් ස්වභාවය හඳුනාගැනීම හා එයට පිළියම් යෙදීම.
- පාසල් විනය යහපත්ව පවත්වාගෙන යාමට උදව් කිරීම
- පාසලේ මත්ද්‍රව්‍ය නිවාරණ කටයුතු උසස් මට්ටමක පවත්වාගෙන යාම.

- සිසුන්ගේ සංවර්ධනය අරමුණු කරගනිමින් දෙමාපිය දැනුවත් කිරීම සිදුකිරීම.
- සිසුන්ගේ විෂය තෝරා ගැනීමේ ක්‍රියාවලියේදී සහාය වීම.
- එනෙත් කාලීන වශයෙන් පැන නැගෙන අයහපත් තත්ව වලදී එයට අදාල ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම උදාහරණ-හදිසි ආපදාවන්, අයහපත් ප්‍රචාරයන්
- අනාගත වෘත්තීය ලෝකයට සිසුන් යොමු කිරීමට පාසල තුළදී කළයුතු මූලික කාර්යයන් සිදුකිරීම.

(ඇ)කමිටුවේ ක්‍රියාකාරකම්

මෙම කමිටුව සෑම මසකම පළමු සතියේ නිශ්චිත දිනයකදී රැස්විය යුතුයි. අදාල කරුණු පිළිබඳ තීරණවලට එළඹ පාසල් උපදේශන වැඩ සටහන තුළින් ඒවාට පිළියම් යෙදිය යුතුයි.

මේ සඳහා තම පාසල අයත් කලාපයේ/කොට්ඨාසයේ මාර්ගෝපදේශ හා උපදේශන ගුරු උපදේශකවරයාගේ සහාය ලබා ගත යුතුයි.

කමිටු ක්‍රියාකාරකම් වලට අදාලව පාසලේ උපදේශන හා මාර්ගෝපදේශ ගුරුවරයා විසින් වාර්තා ඇතුළත් ගොනුවක් නඩත්තු කළ යුතුයි.

(ඈ)පාසලේ උපදේශන හා මාර්ගෝපදේශ වැඩ සටහනට සහාය ලබාගැනීම.

පාසල් උපදේශනයට අදාලව කෙරෙන විශේෂ පුහුණුවීම් හා වැඩ සටහන් පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශ/පළාත් හෝ කලාප අධ්‍යාපන කාර්යාලවලින් දැනුවත් කරනු ලැබේ.
මෙයට අමතරව විවිධ ආයතනවල සහාය පාසලේ අවශ්‍යතාවය ට ගැලපෙන පරිදි යොදා ගත හැකි අතර. ඒ සඳහා තම කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුයි.

මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු පාසල තුළ ක්‍රියාත්මක කරමින් සිසු පරපුරේ උන්නතිය වෙනුවෙන් ඍජු සහායක් සැපයීමට අප කාගේත් වගකීමකි. ඒ වෙනුවෙන් ඔබ දක්වන සහාය අගය කරමි.

එස්.එම්.ගෝඨාභය ජයරත්න
අධ්‍යාපන ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය